Photo : Lyndon Foo

මෙතෙක් කතාව

මතකයේ කඩතුරාව අතරින් සැරිසරන සිත නැවත නැවතත් තමා වෙත රැගෙන එන හැඟීම් සමුදායක නුපුරුදු බව නිසා නොසන්සුන්වන ලහිරු, ඊට පිලිතුරු සොයා නැවත වරක් පර්ත් පැමිණේ. සුපුරුදු විශ්වවිද්‍යාල භූමියේදී ඔහුට ඇඩම් සහ සමාර් මුණගැසේ... අද එතැන් සිට

පුස්තකාල ගොඩනැගිලි මැදිකර තිබූ මැද මීදුලේ ගසක් යට ඇති රවුම් මේසයක් දෙපස අපි දෙදෙනා වාඩිවීමු. සමාර් එක තෙක් අපි බොහෝ දේ කතා කළෙමු. හමුවේ මම පැමණ ඇති ගමනේ අරමුණ පිලිබඳව ඔහු ප්‍රශ්න කරන්නට ගියේ නැත. ඔහු එසේ නොකරන බව මම දැනසිටියෙමි. මගේ කෝපි කෝප්පයේ අඩක් හිමිවී ඇත.
ලහිරු එක්ක හිටපු ටාහෑ මට දවසක් මුණගැහුනා.....''
''ඇත්තෙද... දැන් මොනවද කරන්නෙ එයා''

මම බලාපොරොත්තු සහගත මුහුණකින් ඔහු දෙස බලා සිටියෙමි. අපි මේ දැන් කතා කරන්නට යන්නේ මගේ අනාගතය පිළිබඳවය යන හැඟීමක් සිතේ ඇති විය.

''දැන් මොනව කරනව ද කියල නම් මම හරියටම දන්නෙ නැහැ... නමුත් ටාහෑ හිතාගෙන ඉන්නේ ගුරුවරියක් හැටියට ආසියානු රටකට යන්නයි.....''
ඔවුන්ගෙන් එහා මම සමුගත්තේ ඉන් ඉදිරියට ටාහෑ පිළිබඳව ලබාගත හැකි තොරතුරක් නොමැතිවිය.එදින රාත්‍රියේ මම එක්තරා හිගමනයකට දැඩිව වළඹිමියෙමි. එහෙම්මේ ගමන මම පැමිණි සිටීන් ගේ වෙනත් කිසිවක් නිසා නොව ටාහෑ මුණගැසීමේ අරමුණින් බවය.

මම පසුදා උදෙන්ම මහේලා සිටී නවාතැන සොයා ගියෙමි. ආරම්භ කළ යුත්තේ එතනින් යැයි මගේ සිත කියයි. මා යන ඊටත් මහේලා නිදි ඇඳේය. මගේ දෑතඟයෙන් ඔහු මහත්සේ පුදුම වූ බවක් පෙනෙන්නට තිබිණි. කිසිවක් නොකියා ඇස් උඩ තබාගෙන මොහොතක් බලා සිටියේ එබැවින් ඊය යුතුය.

''මොකක්ද ඔච්චර පුදුමෙ.....'' මා ඇසුවේ සිනාසෙමිනි.
''පුදුම නොවී කොහොමද? උඹට ගෙදර යන්න තිබුනෙ හරි ලොකු හදිසියක් නේද?''
''ඉතින්''
''ඉතින් ගිය පයින් ආපහු මොකද?''
''ගිය පයින් වෙන්නෙ කොහොමද? දැන් මාස කියක් ගිහින්ද? ''
''උඹලෑ ගුප්ප්වේගින් එකත් ළඟයි නේද...? ඒකටත් එක්ක ද උඹ ආපහු ආවේ.....?''
මට ඒ ගැන සිහිකක් තිබුණේ නැත. එසේනම් ටාහෑ මුණගැසීමට ඒ ඉතා හොඳ අවස්ථාවක් හොවන්නේ ද?
''මට ඒ ගැන හම් මතක තිබුනෙ නැහැ මහේලා...මම ඔයේ හිකමී ආව.....''
''හිකමී ආව''
''ඔව්''
''උඹ හරි යකාගෙ බඩුවක්නෙ, ලහිරු.... උඹලෑ තාත්තට සල්ලි තියන හිතා හොඳයි.....''
''එතකොට සල්ලි නැති කමටද උඹ මෙහාට වෙලා දෙමව්පියන්ගේ සල්ලි කකා ඉන්නේ.... ඕක ඉක්මනට ඉවර කරගන්නං නැතුව''
''හෑ මවං මේ අදුරුදප්පෙ කතා හොඳිමහරි ගොඩ දාගන්නව ඔක්කොම''
''ඇති යන්තම් ඔහොමවත් මොලේ පෑදිල තියනව උණේ....''
''ඒක හෙමෙයි ලහිරු.... උඹ කොහෙද මේ දවස්වල
නැවතිල ඉන්නේ''
''තාම නම් තැනක් හෑ මචං ඉක්මනට තැනක් හොයන්න ඕනේ....''
''ඇත්ත ද.... මට වත්... උඹට උදව්වක් කරන්න තිබුණහම් හොඳයි.....'' කියමින් ඔහු කල්පනාවට වැටුණි. මට ඔහු ගැන පුදුමයක්ද ඇතිවීය.

''ඒකෙ ප්‍රශ්නයක් නැහැ මහේලා... මම ආවෙ උඹට ඒ ගන කරදරයක් කරන්න හෙවෙයි. පස්සේ හිමින් තැනක් හොයා ගන්නව. ඒක හෙමෙයි.... උඹට හවස වැඩක් තැත්නම් යමු පිටර් අන්කල්ලෑ ගෙවල් පැත්තේ....''
මහේලා එකවරම කිසිවක් කීවේ නැත. 'මූට මොනව වෙලාද මේ' මට මහේලා ගැන පුදුමය. වෙහදාකනම් ඔහු එක පයින් කැමැත්ත දක්වන ගමනකි ඒ. මම විශේෂයෙන්ම මහේලා සමග ඒ ගමන යාමට කැමති එවිට පානකින් මාත් අතරට ඔහු ඉතා හොඳ පලිහක් වන බැවිනි.

''අද හවස මට වෙන වැඩක් තියෙනව මචං.... සොර''
''උඹට වැඩ තියෙනවනම් මම කරදර කරන්නෙ නැහැද..... අපි එහෙනම් වෙන දවසක යමු...''
මම බලාපොරොත්තු වුවාවක් වඩා ඉක්මනින් පිටව ආවෙමි. ඇසීමට බලාපොරොත්තුව සිටියේ ටාහෑ පිළිබඳව වුවද හිතට හොඳ පැහැදිලිවූ කුමනහෝ හේතුවක් නිසා මම කිසිවක්ම නොඇසා නැවතා පැමිණියෙමි.

එදින රාත්‍රියේ පිටර් අන්කල්ගේ ගෙදරදී මට කලින් දැන හඳුනාගෙන සිටි කිහිපදෙනෙක්ම මුණගැසුණි. පානකිටත් මීතුරිය මීතුරියත් තව කිහිප දෙනෙක්ම වූ බැවින් මට ඊතරම් කරදරයක් වූයේ නැත. අන්කල්ගේ කරදරයට ම මම එදා එහි නැවතුණෙමි.
පසුදා උදේ ගේ මේසයේදී පානකි එසින් මිතුකරන ලද කාරණය මා තුළ එක්තරා කුකුසක් ඇති කරන ලදී.

''අපි මහේල අයියටත් එන්න කිව්ව... ලහිරු අයියගෙ යාලුව නිසාම...එතවයි කියල නේද අම්මම හිටියෙ එයා....''
''මට කෝල් එකක් දුන්න හදිසි වැඩක් නිසා එන්න වෙන්නෙ නැහැ කියල'' ඒ කතා කළේ දිනේශ් ය. මම තව වරක් මහේල පිළිබඳව පුදුම වූමෙමි. ඇසිය යුතු ප්‍රශ්න සියල්ල අඩුතැබිව පානකි එසින් අසනු ලබයි. මා කලේ හිඟඩවම අසා සිටීමය.

''කොයි වෙලාවෙ ද ඔයාට කෝල් කලේ''
''දවල්... මගෙ මෝබයිල් එකටයි ආවෙ...''
''ඉතින් ඔයා කිව්වෙ නැත්ද ලහිරු අයිය ඇවිත් ඉන්න බව''
''කියන්න තමයි හිටියෙ මම. ඒත් මුකුත් කතාකරන්නත් කලින් හරිම හදිස්සියකින් වගේ තිබ්බ ලෝන එක''
''එන් එකක් ගන්න බලන්න ආයෙ.... සමහරවිට ලහිරු අයිය ඉන්න බව දැනගත්තොත් දැන් හරි එයි''
දිනේශ් කෑම මේසයේ සිටම ඔහුගේ දුරකථනය ක්‍රියාත්මක කරයි.
''කාල ඉන්න ළමයිනේ ඔක්කොටම ඉස්සෙල්ලා'' ශ්‍රේස් ඇන්ටිට අවශ්‍ය වන්නේ එපමණකි.
''වඩා කරන්නෙ නැහැද වගේ''
''කෝ දෙන්න බලන්න...'' පානකි කෑම මේසයෙන් ඉවත් වී දිනේශ්ගේ පංගම දුරකතනය අතට ගත්තේ ඔහුගේ වරදක් නිසා පිළිතුරක් නැති බව හඟවමිනි. මදක්වෙලා උන්සාහ ගත්තත් අයෙ ද කිසිවක්ම හොලැබිණි.
''කාල ඉන්න ජානකී ඉස්සෙල්ලා...''
''මට ඇති....''
''එහකොට දිනේශ්.....''
''මටත් ඇති....''

පිම්බත් වැටෙන තරමයි මේගොල්ලන්ගේ ඇඟවල්. ඒ උදාට කෑම ඊකක් කන්න බයයි මහත්වෙයි කියලා.... අනේ මන්දැ අපි නම් ඔය කාලෙ හොඳට කෑව ඕවිව... අපේ වයසට එහකොට මේගොල්ලන්ගෙ ඇඟට කෝටු බඳින්න වෙයි කෙලින් කරන්න....''
ඇන්ටි ඒ කියාගෙන යන්නේ මට ය. ඒ අතර ම අන්කල් ද කුස්සියට පැමිණියේ ය. ඊයෙ රෑ පදම නිවී යන්න ඇත්තේ දැන්ය.
''මම බැලුව කාත් එක්කද මේ ශ්‍රේස් හයියෙන් හයියෙන් කතා කරන්නෙ කියල.... පුතා ඉන්න බව මට අමතක උනාසෙ''

ඇන්ටි ඔහුට පිළිතුරු වශයෙන් යමක් කියන්නටත් කලින් ඕත්තියෙහි වල්ලා ඇති දුරකථනය නාදවීය.
''අන්න ආරක මලන්න''
ඇන්ටිගේ ඒධානයට අනුව අන්කල් දුරකථනයට පිළිතුරු දෙයි. ඒ අතර ජානකී උත්සාහය අන්හැර ඇත.
''ඒකේ බැටරි බහැලල ඇති.. පස්සෙ බලමු දවල්වෙලා ආසෙන්....''

අන්කල්ගේ දුරකථන කතාබහට කන්දීමට මට අවශ්‍ය නොවුනා ද එය මා සම්බන්ධ කර ඇත්තක් බව පෙනී ගියෙන් මම ඉතා ඕනෑකමින් ඇතුම්කන් දුන්නෙමි. ඒ කතාකරන්නේ තාත්තා වීය යුතුය. 'මේ තරම් උදෙන්. තාත්තා හැඟිවීට ගමන් වෙන්න ඕනේ' මගේ සිතට ඕයක් ඇතුළු විය.

''ඇයි අන්කල් හදිස්සියක් දෑ?''
''හෑ පුතා කිසි හදිස්සියක් නැහැද.... නෑ නෑ රිචඩ් මේ ලහිරු පුතාටයි මම කිව්වේ...?''
අන්කල් දෙපැත්තට ම කතා කරයි.

''ආ මෙන්න... පුතාට කතා කරනව තාත්ත''මා හැඟිට දුරකථනය අතට ගත්තේ චකිතයකිනි.
''හලෝ....''
''හලෝ පුතා.. ඔයාට ගන්න බැට උන නිසයි මම පිටවට කතා කළේ... රිය රෑ මෙහෙද හිටියෙ... හොඳයි මම මේ කතා කළේ ඔයාගෙ කොන්ට්‍රැක්ෂන් එකට ලියුමක් ඇවිත් තියනව... ඔන්න අම්ම ගන්නව ෆෝන් එක....''

මම හිඟඩව ම අසා සිටියෙමි. මොන ආකාරයේ කාරණයක් කතා කරන්නට වුව ද දෙමව්පියන්ගේ කටහඬට සවන්දීමට ලැබීම දුරවඩාත්ම මොනතරම් සතුටක් ද? විශේෂයෙන්ම හුදකලාවෙන් පිරි රටක තනිකමක් දැනෙන දරුවෙකුට..

''පුතා... ඔයා හොඳින් ඉන්නව නේද?'' ඒ කටහඬ දයාබරිතය. අම්මාට පිළිතුරක් අවශ්‍යය. හිඟඩව සිටින්නේ එබැවිනි.

''ඔව් අම්ම මම හොඳින් ඉන්නව....''

''පුතා අම්මට කියන්න ඔයාට මෙහෙ නවතින්න පුළුවන් බව... නැත්නම් ඉන්නකො මම තාත්තට කතාකරන්න....''
ඒ කතා කරන්නේ පිටර් අන්කල් මටය. අන්කල් සිතන්නේ තවමත් ඒ අතීතයේ සිටය. ඔහුට වඩා තාත්තා හිතී එති අතින් තද බව අන්කල් දනී. මගේ සිතිවිලි පසෙකලා මම අම්මාට අදහුම්කන් දුනිමි.

''පුතා පෙබරවාරි විසි දෙක තියෙන්නෙ රියෙයි ලියුම් ආවෙ. පුතත් ඔහෙ ඉන්න එකේ තාත්තයි මමයි එන්නයි ඉන්නේ.... ආ.... තාත්ත ගන්නව ඔන්න....''
මට ඒ ගැන කිසිවක් කියන්න ඉඩ ලැබුණේ නැත.

''ලහිරු.... ඔයා පිටර් අන්කල්ල එක්කම ඉන්න. මම පිටර්ට කතා කරන්නම්. තව සති දෙකකින් මමයි අම්මයි එනව... කෝ දෙන්නකො ෆෝන් එක පිටර්ට....''
''අන්කල් තාත්ත කතා කරනව....''

මම දුරකථනය නැවත අන්කල්ට බාර දුනිමි. තාත්තා යමක් හිරණය කරන ඊට මගේ අදහස් ඔහුට අවශ්‍ය නැත. දැන් මට සිදුවන්නේ මා කැමතිවුවද, අකැමැති වුවද මෙහි නැවතීමටය. මට රියේ උදෑසන මහේලගේ ප්‍රතිචාරය සිහිපත් වීය. එක අතකට මේ මිහිසුන් මේ තරම් කරුණාවකින් මා වෙනුවෙන් ක්‍රියා කරන කළ එයට පිටුපා ක්‍රියාකිරීම වරදකි. අන්කල් තාත්තට පිළිතුරු දෙන්නේ අධික ප්‍රීතියකිනි. ''ඔව් වොන්ඩෆුල් රිචඩ්..... මොන කරදරයක් ද.. කොච්චර කාලෙකින්ද අපිට මෙහෙම වාන්ස් එකක් එන්නේ. මෙහෙ හිටපුදෙන් ඕන තරම් කාලයක්.''

ශ්‍රේස් ඇන්ටි ඒ මොහොතට මගේ කාමරය සූදානම් කර හමාරය. අන්කල් මොකොතක් හෝ පුම්බා නොවී මා සමග පිටත්වූයේ මගේ බඩු පිටුවූ රැගෙන ඒමටය. මට ගෙන ඒමට ඇත්තේ ඇඳුම් කිහිපයක් පමණි. දිනේශ් ද අප සමග පැමිණියේය. මම ඒ අතර සිතිවිල්ලට වැටුණෙමි. 'මගේල ඇයි මා මඟ හැරීමට බලන්නේ. ඉපට මගෙන් හංගන්න ඇත්තේ කොකක්ද' මට මේ කිසිවක් පැහැදිලි නැත. අතික් කරුණු කෙසේ වුවද ටාහෑ පිළිබඳව මා හොලන්නා තොරතුරු මහේල දන්නවා ඇත යැයි මගේ යටි සිත රැගෙන එන පණිවිඩය පිළිගැනීමට මම මැලිවෙමි. ඒ සිතිවිල්ල සිතට ඕයක් ඇතැලු කරයි. කලින්දා රෑම තීරණය කරගත් පරිදි මම සපදා උදේ ම පර්ත් ප්‍රධාන දුම්රිය

නැවතුම්පල අසල ඇති නැතිවුනු බඩු බාරදෙන ස්ථානයට ගියෙමි. මා දුම්රියේ අමතක කළ පාර්සලය ඔවුන්ට ලැබී තිබුණහොත් කුමන හෝ තරක් නොවුනු දෙයක් එහි ඇත්නම් එය ශ්‍රේස් ඇන්ටිට ගෙන ගොස් දීමට සිතාගනිමි.

තාත්තා පැමිණීමට කලින් ඒ වෙනුවෙන් කුමක් හෝ කළ යුතුය. නැතිවූන පාර්සලය මට ලැබිණි. එතනම එය ඩබා විවෘතකළ මම කෑම පාර්සල් දෙක කුණු බක්කියට අත ඇරියෙමි. නමුත් මට සැසඳිමට එහි තව ඉතිරි වුණු දෑ වීය. තල කැරලි පාර්සලය ගැන මා සතුටුවූයේ එය අන්කල්ගේ ප්‍රියතම කෑමක් බව දන්නා බැවිනි. ඇන්ටි වෙනුවෙන් වූ බතික් ගවුමක්ද එහි වීය.

ඉතිරිව ඇති දෑ සමග මම දුම්රිය වේදිකාව මතට පැමිණියෙමි. මට මෙතෙහින් ඉවත්වීමට සිත් දෙන්නේ නැත. වේදිකාව මත වූ දිගු බංකුවක මම හිඳ ගතිමි. දිගා දෙකකට යුගල වශයෙන් දිවෙන දුම්රිය හතර, වරින් වර වේදිකාවේ නවතා තබා මොහොතකින් පිටවී යයි. දුම්රිය පිටත්වීමත් සමග හිස්වන